සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**13 ශ්‍රේණිය** | **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය** | **පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (2) | 02. (4) | 03. (3) | 04. (4) | 05. (1) | 06. (2) | 07. (1) | 08. (2) | 09. (3) | 10. (2) |
| 11. (3) | 12. (3) | 13. (2) | 14. (1) | 15. (3) | 16. (5) | 17. (1) | 18. (4) | 19. (3) | 20. (4) |
| 21. (2) | 22. (4) | 23. (5) | 24. (5) | 25. (1) | 26. (4) | 27. (1) | 28. (2) | 29. (5) | 30. (3) |
| 31. (4) | 32. (4) | 33. (4) | 34. (2) | 35. (4) | 36. (2) | 37. (3) | 38. (3) | 39. (2) | 40. (3) |
| 41. (5) | 42. (1) | 43. (2) | 44. (4) | 45. (4) | 46. (1) | 47. (3) | 48. (1) | 49. (2) | 50. (5) |

(ලකුණු 100)

## II කොටස

.01. (1) භාෂාවක් ග්‍රහණය කර ගැනීමට හුරුවීම හා භාෂාවේ පරිහරණය ඉගෙන ගැනීම භාෂා උපාර්ජනයයි.

(2) අනන්‍ය ලක්ෂණ වෙනස් කළ භාෂාවක් භාවිතය./
මිශ්‍ර භාෂාවක් යොදාගන්නා අවස්ථා ( ඉංග්‍රීසි සිංහල)
සදාචාර විරෝධි හා ආවේගශීලි භාෂා යෙදීම් සිදුකරන අවස්ථා.
නූතන මාධ්‍ය තුළ පොදු භාෂාවක් යොදා නොගන්නා අවස්ථා.

(3) භාෂණය සුහද සාකච්ඡා, ගීත ඉදිරිපත් කරන වැඩසටහන්
රූපණය ගුවන් විදුලි නාට්‍ය
ලේඛනය පිටපත් සහිත වැඩ සටහන් , තිර නාටක.
කථනය ප්‍රවෘත්ති
විවරණය දේශපාලන සාකච්ඡා අධ්‍යාපන සාකච්ඡා

(4) මාධ්‍ය විශේෂිකරණයට ලක්වීම / අන්තර්ජාල භාවිතය ව්‍යාප්ත වීම / නව සංස්කෘතික රටාවක් මිශ්‍රවීම / මාධ්‍ය බහුවිධකරණය වීම / තාක්ෂණය බහුල වීම.
මෙම කරුණු පැහැදිලි කළ යුතු ය.

02 (1) ඇසිම → තේරුම් ගැනීම → ඇගයීම → ප්‍රතික්‍රියා දැක්වීම

(2) ඵලදායි කථනය / ශ්‍රවණ නිපුණතා සංවර්ධනය / සහවේදනය / සහානුභූතිය / ආචාරශීලීත්වය

(3) ශ්‍රවණ නිපුණතාවය සන්නිවේදනයේදී අත්‍යාවශ්‍යම අංගයකි. මෙහිදි හොඳින් ශ්‍රවණයකර තේරුම් ගැනීමෙන් අනතුරුව ප්‍රතික්‍රියා දැක්වීම මත සන්නිවේදනය සාර්ථක වේ.
දුර්වල ශ්‍රවණ තත්ත්වයන් ඇතිවීමට හේතු ලෙස , අවධානයක් නොමැතිව අසා සිටීම
අසා සිටීමට පුරුද්දක් නොමැතිවීම / උනන්දුවක් හෝ උවමනාවක් නොවීම.
ආදි කරුණු දැක්විය හැකි ය.

(4) සමූහ සන්නිවේදනය යනු දෙදෙනෙකුට වඩා වැඩි පිරිසක් අතර සිදුවන සන්නිවේදනයයි. සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා නිපුණතා සංවර්ධනය වීම වටී.
සමූහය හඳුනාගැනීම / සාමූහික වැඩ, වගකීම හා වගවීම. / ඒකඟත්වය හා විසම්මුතිය / සම්මුඛ සාකච්ඡා ආචරශීලීත්වය
ඉහත නිපුණතා සංවර්ධනය ඉතාමත් වැදගත් ය.

03 (1) සංස්කෘතිය යනු සාමාජිකයන්ගේ ජීවන ක්‍රමවලට එනම් ඔවුන් විසින් ඉගෙන එක් රැස් කොට ගත්තා වූද බෙදා හදාගෙන පරම්පරාවෙන් පරම්පරාවට ගෙනයනු ලැබුවා වූත් අදහස් උදහස් පලපුරුදුය.

(2) මාධ්‍ය මගින් සංස්කෘතිය හඳුන්වාදීම , ගොඩ නැගීම මෙන්ම සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමද සිදු කරයි. සංස්කෘතිය ආරක්ෂා කරන අතර පරම්පරාවෙන් පරම්පරාවට රැගෙන යයි. / මාධ්‍යයේ පැවැත්මට සංස්කෘතිය හේතුවන අතර සංස්කෘතිය වෙනස් කිරිම මාධ්‍ය මගින් සිදුවීම ද, මාධ්‍ය පාලනය කිරීමත් සංස්කෘතිය මගින් සිදුවීමද හඳුනාගත හැකි ය.

(3) සෑම සමාජ පන්තියක්ම ආකර්ෂණය කර ගනියි. වාණිජත්වය සමග බැඳී පවතී. කල් පවත්නා ස්වභාවයක් නැත. ජනමාධ්‍ය මගින් ව්‍යාප්ත වේ. මහා පරිමාණ ලෙස නිෂ්පාදනය හා ව්‍යාප්තියක් පවතී.

(4) මාධ්‍ය සංස්කෘතිය මගින් සංස්කෘතියක් ඇති කෙරේ. / නව ආරක සමාජ රටාවක් ගොඩනැගීමට මෙය හේතු පාදක වේ./ ව්‍යාපාරික ආධිපත්‍යයක් මෙහි පවතී. / නව පාරිභෝගික රටා හා නව විලාසිතා ආදිය සමාජගත වේ. / බටහිරකරණයට නැඹුරු වේ.

04 (1) මහජන සම්බන්ධතා සඳහා සම්බන්ධවන බාහිර හා අභ්‍යන්තර සාමාජිකයන් මෙහිදී මහජනයා නම් වේ.

(2) මුද්‍රිත මාධ්‍ය / ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය / ඡායාරූප / ප්‍රදර්ශණ / මාධ්‍ය සම්බන්ධතා / අනුග්‍රාහකත්වය / පාරිසරික මෙවලම්

(3) හරය සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම. / මූලික තොරතුරු ගවේෂණය කිරීම / නිවේදනයට අදාළ අරමුණු ගොඩනැංවීම / අදාළ තොරතුරු සැලකිල්ලෙන් තෝරා ගැනීම / තොරතුරු නිර්මාණශීලිව ගොනු කිරීම / සියලු මාධ්‍යයන්ට උචිත ලෙස සැකසීම.

(4) ආයතනයට සම්බන්ධවන බාහිර පුද්ගලයින් ඉතා වැදගත් සාමාජිකයන් පිරිසකි. ඔවුන්ට ප්‍රියමනාප හා ආකර්ශනය තත්වයක් ඇති කිරීම මගින් ආයතනයේ ඉදිරි ගමන හා කීර්තිනාමය ශක්තිමත් වේ. බාහිර මහජන සම්බන්ධතා විධික්‍රම භාවිතය ඊට උපකාරී වේ.

- භෞතික පරිසරය ප්‍රියමනාප කිරීම / දිසා දක්වන පුවරු ආදියෙන් විවිධ අංශ ආදිය සොයා ගැනීමට පහසු කිරීම / ආපන ශාලා අංක මේස සංහිත රථගාල් පුවත්පත් නානකාමර ආදිය සැපයීම.
- පිළිගැනීමේ නිළධාරිනියක් / විමසුම් නිළධාරින් පත් කිරීම
- සේවකයන්ට නිශ්චිත ඇඳුමක් දීම මගින් ප්‍රියමනාප බව ඇති කිරීම.

05 (1) දෙදෙනෙකු අතර සිදුවන සන්නිවේදනය අන්තර්පුද්ගල සන්නිවේදනයයි. මෙහිදී ප්‍රතිපෝෂණය සක්‍රීය වේ.

(2) දෙදෙනෙකු අතර සිදුවන නිසා ඉඟි, අංග චලන, ඇස් සම්බන්ධතා, ස්පර්ශය, උච්චාරණය ,වේගය ආදී විවිධ නිර්වාචික සන්නිවේදනයන්ගේ සහය ලබාගත හැකි ය.

(2) තමා පිළිබඳව තමා තුළ ඇති ආකල්පය සරලව ස්වසංකල්පය නම් වේ.

- ස්වසංකල්පය පෝෂණය කිරීම අත්‍යවශ්‍යය. එනම් තමන් තුළ ස්වයං ශක්තිමත් හා ආත්ම විශ්වාසයක් ඇතිවීම කෙරෙහි මෙය වැදගත් ය. තමා පිළිබඳ සමාජයේ හොඳ ප්‍රතිරූපයක් ඇති කර ගැනීමට නම් මුලින් තමා තමා පිළිබඳ දැනුවත් වී තම ආකල්ප සංවර්ධනය කර ගැනීම වැදගත් ය.

(4) නව මාධ්‍ය නොහොත් ජංගම දුරකථනය හා අන්තර්ජාලය භාවිතය සීග්‍රයෙන් වර්ධනය වෙමින් පවතී. මේවා තාක්ෂණික වශයෙන් භාවිතයට පහසුවීම මෙන්ම වේගවත් හා කාර්යයන් රැසක් ඉක්මනින් එකම උපකරණයෙන් සිදුකර ගැනීමට හැකි නිසා කාර්යබහුල සමාජයේ මෙම මාධ්‍ය ව්‍යාප්තව ඇත. නව මාධ්‍ය වල ඇති ආකර්ෂණීය ප්‍රවේශයන් නිසා ඒවාට සමාජය දැඩිව යොමු වී ඇත.

06 (1) ගෝලීයකරණය යනු දේශිය හා කලාපිය ප්‍රපංචයක් ගෝලීය ප්‍රපංචයක් බවට පත්වීමයි. එය සරලම අදහසයි.

(2) ජාතික රාජ්‍යයන් දුර්වල වීම / ද්‍රව්‍යමය ආර්ථිකය අභිබවා මූල්‍යමය ආර්ථිකය ශක්තිමත් වීම / ගෝලීය තොරතුරු අවකාශයක් නිර්මාණය වීම / සන්නිවේදනය හා ජනමාධ්‍යයන් ඒකීය බවට පත්වීම / නව මාධ්‍ය වර්ධනය / නව සංස්කෘතික ස්වරූප හා විචිත්‍ර සංස්කෘතිය ඇතිවීම.

(3) රටේ ප්‍රධාන මාධ්‍ය ධාරාවට පරිබාහිරව ක්‍රියාත්මක වන මාධ්‍ය ශෛලයකි. සාම්ප්‍රදායික හා බලවත් මාධ්‍ය ආයතනවලට එරෙහිව ගොඩ නැගේ.

ලාභ ඉපැයීම ප්‍රධාන අරමුණ නොවේ/ ග්‍රාහක පිරිස සීමිතය / මතවාදි කාර්යයන් සිදු කෙර් / සමාජ බලපෑම අධිකය / අන්තර්ගතය ප්‍රධාන ප්‍රවාහයට වෙනස්ය / එක් පුද්ගලයෙකු හෝ කීප දෙනෙකු එයින් පවත්වාගෙන යනු ලබයි.

(4) ඕනෑම පුරවැසියෙකුට සම්බන්ධ විය හැකි ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක පවතින්නකි.

පුරවැසි ප්‍රශ්න ගැටලු ඉදිරිපත් කිරීමට ද ඔවුන්ගේ දෘෂ්ඨියෙන් ඔවුන්ගේ හඬ ඉස්මතු කිරීමට ද අවස්ථාවකි. / සමාජ අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියාත්මක වේ/ මාධ්‍ය ත්‍රිත්වයම යොදාගත හැක / සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය උත්කර්ෂණය කරයි / අධ්‍යාපන සෞඛ්‍ය ගැටලු ආදී ඕනෑම දෙයක් ඉදිරිපත් කළ හැක./ පුරවැසි ජීවිතයේ ගුණාත්මක බව පෝෂණය වේ.

07 (1) තොරතුරු සම්පාදනය / අධ්‍යාපනය / විනෝදාස්වාදය / පෙළඹවීම

(2) දෙදෙනෙකුට වැඩි හඳුනාගත හැකි සමූහයක් සිටියි / ප්‍රතිපෝෂණය සක්‍රිය වේ/ උපකරණ භාවිතයෙන් සන්නිවේදනය සාර්ථක කරගත හැක / මෙයට පන්තිකාමරයක්, කාර්යාලයක් හඳුනාගත හැකිය / එක මාර්ගිකව හෝ ද්වි මාර්ගිකව තොරතුරු ගලා යයි.

(3) අවිධිමත් සන්නිවේදනයේ පැතිරීම වේගවත් ය./ නිශ්චිත න්‍යාය පත්‍රයකට අනුව සිදු නොවේ/ එදිනෙදා ජීවිතයේදි අත්දැකීමට සිදුවේ / විවිධ ස්වරූපයෙන් අවිධිමත්ව සන්නිවේදනය වේ. කටකතා ඕපාදූප මේ අතර ප්‍රමුඛය. / දාමයක් රැසකින් හඳුනාගත හැක. ඕපාදූප දාමය, පර්ෂද දාමය, සම්භාවිතා දාමය....

(4) වාචික සන්නිවේදනය සාර්ථක කර ගැනිමට.

පැහැදිලි වචන උච්චාරණය / නියමිත වේගය / පොදු භාෂාවක් භාවිතය / ආවේගශීලි නොවීම / ග්‍රාහකයාගේ තත්වය තේරුම්ගෙන සහානුභූතියෙන් සන්නිවේදනයේ යෙදීම. ආදී කරුණුවලට අවධානය යොමු කිරීම වැදගත්ය. ( විස්තර කර තිබිය යුතුයි.)